# අම්බලන්තොට ප්‍රාදේශිය සභාව.

## හම්බන්තොට දිස්ත්‍රික්කය.

01. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 25 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය.

මාගේ පරීක්ෂණයේ පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2010 දෙසැම්බර් 31 දිනට අම්බලන්තොට ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරීත්වය පිලිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති.

මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු.

(අ) සමාලෝචිත වර්ෂයේදි දරන ලද රු. 375,550 ක ප්‍රාග්ධන වියදම් , අයභාර වියදම් ලෙස ගිණුම්ගත කොට තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදිගත් රු. 1,003,068 ක් වටිනා ස්ථාවර වත්කම් අදාල වත්කම් ගිණුම් හර කොට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම බැර කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමේ ප්‍රාග්ධන ආදායම් යටතේ මූලධන ආධාර රු. 55,756,430 ක් 3 - 81 ආදායම් ශීර්ෂය යටතේ පෙන්වා තිබුණි. එකී මුදල තුළ දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් රු. 16,541,315 ක මුදලක් ණය ආධාර ලෙස ප්‍රාග්ධන ආදායම් යටතේ වෙනම දක්වා නොතිබුණි.

(ඈ) ඉදිකිරීම් කර්මාන්ත 03 ක් සඳහා 2010 දෙසැම්බර් 31 දිනට රු. 415,000 ක ණයහිමියන් ඇති කර තිබුණද , එකී කර්මාන්ත 2010 දෙසැම්බර් 31 දිනට නිමකර තිබූ බවට කාර්මික නිලධාරීගේ සහතිකයක් හෝ එකී වැඩය 2010 වර්ෂය තුළ ආරම්භ කර තිබූ බවටද කරුණු අනාවරණය නොවීය.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී බෝලාන උපකාර්යාලයේ පුස්තකාල අළුත්වැඩියාව සඳහා 2010 පෙබරවාරි මස වැය කරන ලද රු. 34,400 ක මුදල ප්‍රාග්ධන වියදම් සේ සලකා 309 වැය ශීර්ෂයට හර කර තිබුණි.

(ඊ) වැය ලේඛනය අනුව 2010 දෙසැම්බර් මාසයේ වැටුප් හා දීමනා ගෙවීම් වියදම රු. 747,985 ක් වුවද එය ප්‍රධාන ලෙජරයට උපුටා ගැනීමේදී රු. 757,235 ක් ලෙස පිටපත්වීම හේතුවෙන් වියදම රු. 9, 250 කින් වැඩියෙන් සටහන් වී තිබුණි.

1.3.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

(අ) <u>පිළිතුරු නොලත් විගණන විමසුම්.</u>

2010 දෙසැම්බර් 31 දිනට විගණන විමසුම් 07 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර , එකී විමසුම් වලට භාජනය වූ ගණනය කල හැකි ගණුදෙනු වල වටිනාකම රු. 3,285,410 ක් විය. පිළිතුරු නොලත් විගණන විමසුම් වල කාල විශ්ලේෂණ පහත සඳහන් පරිදි වේ.

| | විමසුම් ගණන |
|---|---|
| මාස 03 සිට අවුරුදු 01 දක්වා | 01 |
| අවුරුදු 02 සිට අවුරුදු 03 දක්වා | 06 |

(ආ) <u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 53,901,506 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සභාවේ තැන්පත් ශේෂ විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

1.3.4 <u>අනුකූල නොවීම්.</u>

පහත දැක්වෙන නීති ,රීති , රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති ,රීති , රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත</u>.** | |
| 219 (i) වගන්තිය | සභාවක කිසිම සභිකයකුට හෝ සේවකයකුට ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුම් නොතිබිය යුතු වුවත් ඊට පරබාහිරව නිලධාරීන් දෙදෙනෙකු කටයුතු කර තිබුණි. |
| **(ආ) 1988 ප්‍රාදේශීය සභා රීති <u>( මුල්‍ය හා පරිපාලන) මාලාව.</u>** | |
| රීති 188 | සියළුම ණය හා ණය ආපසු ගෙවීම් සම්බන්ධයෙන පි.එස්. 44 ආකෘතියට අනුව ලේඛනයක් පැවැත්විය යුතු වුවද සභාව විසින් දේශිය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් රු. 16,541,315 ක ණය සම්බන්ධයෙන් එවැනි ලේඛනයක් පවත්වා නොතිබුණි. |

(ඇ) <u>දකුණු පළාත් සභා මුදල් රීති සංග්‍රහය</u>

| | |
|---|---|
| මුල්‍ය රීත 546.1 | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි. |

(ඈ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.</u>

| | |
|---|---|
| මු.රෙ. 1645 හා1646 | වාහන 15 කට අදාලව මාසික වාහන සංසිද්ධි සාරාංශ සමඟ දෛනික ධාවන සටහන් පත් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුලදී එසේ කර නොතිබුණි. |

(ඉ) <u>රාජ්‍ය මුදල් චක්‍රලේඛ.</u>

| | |
|---|---|
| 2009 සැප්තැම්බර් 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පිඑෆ් 437 | අනුමත ආයතනයෙන් පරිබාහිරව සභාවට අයත් මෝටර් රථ රක්ෂණය කර තිබුණි. |

02. <u>මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.</u>

2.1 <u>මුල්‍ය ප්‍රතිඵලය.</u>

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව , 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු: 10,440,273 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු: 10,579,354 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.
------------------------

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| වරිපනම් හා බදු | 1,014 | 463 | 2,108 | 1,203 | 616 | 2,127 |
| බදුකුලී | 10,671 | 9,664 | 1,965 | 6,393 | 6,277 | 2,806 |
| බලපත්‍ර ගාස්තු | 2,098 | 1,996 | 234 | 1,653 | 1,501 | 213 |
| සේවා සඳහා ගාස්තු | 3,115 | 3,078 | 60 | 1,515 | 1,479 | 76 |
| වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 6,812 | 922 | 7,516 | 9,224 | 724 | 10,187 |
| වෙනත් ආදායම් | 5,967 | 1,968 | 4,111 | 7,296 | 1,420 | 5,969 |

2.2.2 <u>උසාවි දඩ මුදල්</u>

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු. 7,516,019 ක දඩ මුදල සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.3 <u>මුද්දර ගාස්තු.</u>

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් රු. 4,027,050 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.4 <u>ඉඩම් බදු.</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 153(1) වගන්තියේ විධි විධාන අනුව සංවර්ධනය නොකල ඉඩම් සඳහා ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2% ක් නොඉක්මවන බද්දක් වාර්ෂිකව ඉඩමේ අයිතිකරුගෙන් අයකරගත හැකි බව සඳහන්ව තිබුණද එසේ කටයුතු කර නොතිබුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයට අදාල සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| පුනරාවර්තන වියදම් | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පෞද්ගලික පඩිනඩි | 26,729 | 24,559 | 2,170 | 26,523 | 24,104 | 2,419 |
| අනෙකුත් | 18,043 | 14,214 | 3,829 | 16,057 | 11,013 | 5,044 |
| උප එකතුව | 44,772 | 38,773 | 5,999 | 42,580 | 35,117 | 7,463 |
| ප්‍රාග්ධන වියදම් | 96,196 | 64,931 | 31,265 | 97,494 | 23,087 | 74,407 |
| මුළු එකතව | 140,968 | 103,704 | 37,264 | 140,074 | 58,204 | 81,870 |

2.4 අධිභාර

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යවස්ථාපිත විධි විධානයන්ට අනුකූලව මවිසින් 1975 - 1987 කාලය තුළදී පනවන ලද අධිභාර 13 ක් වෙනුවෙන් අයවිය යුතුව තිබූ මුදල රු. 56,229 ක් විය.

2.5 මානව සම්පත් කළමණාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 02 | 03 |
| ද්විතීයික | 17 | 18 |
| ප්‍රාථමික | 53 | 46 |
| වෙනත් (අනියම්,තාවකාලික) | - | 41 |

(ආ) 2006 අප්‍රේල් 10 , 2006 මැයි 10 හා 2006 අගෝස්තු 01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28, 28 (i) , 28 (ii) අනුව විධිමත් අනුමැතියක් ලබා නොගෙන සභාව විසින් අනියම් සේවකයින් ඇතුළුව 43 දෙනෙකු බඳවාගෙන සේවයේ යොදවා තිබුණි.

(ඇ) 2010 වර්ෂයේ තථ්‍ය සේවක සංඛ්‍යාව තුළ ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුරක් සඳහන්ව තිබුණද , සමාලෝචිත වර්ෂයේ අනුමත සේවක සංඛ්‍යාවෙහි එකී තනතුර ඇති බව නිරීක්ෂණය නොවීය.

2.6 වත්කම් කළමණාකරණය.

2.6.1 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්.

2006 සැප්තැම්බර් මාසයෙන් පසු ධාවනයෙන් ඉවත්කර තිබූ අංක 53 - 5712 දරණ කැබ්රථය වෙන්දේසි කර විකිණිමට හෝ පොත් වලින් ඉවත් කිරීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.6.2 ලැබිය යුතු ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 45,973,234 ක් වු අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු. 6,921,643 ක් විය.

2.6.3 අයවීමට ඇති සේවක ණය.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 8,483,999 ක් වු අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවිය යුතු හිඟ ගිණුම් ශේෂවල එකතුව රු. 31,000 ක් විය.

(ආ) ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් 2010 දෙසැම්බර් 31 දිනට රු. 180,956 ක් අයවිය යුතුව තිබුණි. එකී සේවක ණය ශේෂ එකවර අයකර ගතයුතුව තිබුණද වාරික වශයෙන් අයකර ගනු ලබන බව නිරීක්ෂණය විය.

2.6.4 <u>අචල ජංගම වත්කම්.</u>

(අ) අම්බලන්තොට නගර ශාලාවක් ඉදිකිරීමට රොඩීමුල්ල ඉඩම අත්කර ගැනීම සඳහා වන්දි ගෙවීම් , මිණුම් හා පුවත්පත් දැන්වීම් ගාස්තු වශයෙන් අම්බලන්තොට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඇප 310 දරණ ගිණුමේ රු. 150,500 ක් 1986 ජුනි 19 වන දින තැන්පත් කර තිබූ අතර, එම මුදල පොලිය සමඟ 2010 දෙසැම්බර් 31 දිනට රු. 1,438,779 ක් විය. පෙර ගෙවුම් යටතේ පෙන්වා ඇති එකී මුදල වසර 25 ක පමණ කාලයක් නිරවුල් නොකර ඉදිරියට එමින් පවතින ශේෂයක් බව නිරීක්ෂණය විය.

(ආ) බටඅත සිහිති පොළ පැවැත්වූ ඉඩම සභාවට පවරා ගැනීම සඳහා 1993 සැප්තැම්බර් 06 දින කුවිතාන්සි අංක 307105 න් අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු. 30,740 ක මුදලක් ගෙවා තිබුණි. එකී ඉඩම පවරා ගෙන නොතිබුණද , ගෙවන ලද මුදල 2010 දෙසැම්බර් 31 දිනටද නිරවුල් කර නොතිබුණි.

2.7 <u>වාහන පාලනය</u>

සභාව සතු එල්ඊ 7437 අංක දරණ කැබ් රථයේ 2008 මාර්තු සිට 2010 පෙබරවාරි දක්වා කාලයට අදාල දෛනික ධාවන සටහන් විගණනය සඳහාද ඉදිරිපත් නොවීය. මෙම කැබ් රථයට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

- ❖ LE - 7437 කැබ් රථයට අදාල දෛනික ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබියදී සෑම මාසයකම ඉන්ධන ලීටර් 400 ට ආසන්න ප්‍රමාණයක් ලබාදී තිබුණි.

- ❖ ධාවන සටහන් ඉදිරිපත් නොකලද වාහනයේ රියදුරාට ගමන් වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේදී රු. 24,138 ක් ගෙවා තිබුණි.

- ❖ කැබ් රථයේ රියදුරාට 2009 වර්ෂයේ කිසිදු දිනක රාජකාරි නිවාඩු අනුමත කර නොතිබු අතර , 2009 වර්ෂයේ මාස 11 ක් තුළ පැමිණීමේ ලේඛනයේ අත්සන් කර තිබුණේ උන 33 ක් පමණි.

- ❖ අංක LE - 7437 කැබ් රථයේ රියදුරු රාජකාරි කටයුතු වලට වාර්තා කල බවට විධිමත් සාක්ෂි නොවුවද 2009 ජනවාරි සිට 2010 ජනවාරි දක්වා රු. 233,520 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

2.8 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා.</u>

(අ) 2007 පෙබරවාරි 28 දින සිට 2009 පෙබරවාරි 28 දින දක්වා කර්මාන්ත 07 ක් වෙනුවෙන් රඳවාගත් 10% බැගින් වු අත රැඳවුම් රු. 64,331 ක් දීර්ඝ කාලයක් තිස්සේ පොදු තැන්පත් ගිණුමේ රඳවා තබාගෙන තිබුණි.

(ආ) 2010 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදයට අයත් මාස 10 ක් තුළ CFL විදුලි පහන් 622 ක් නිකුත් කර තිබුණ අතර, මාස 06 ක කාලයක් තුළ නඩත්තු කල විදුලි පහන් ගණන 648 කි. ඒ අනුව විදුලි පහන් 26 ක් වැඩිපුර නඩත්තු කර ඇති බවද , නඩත්තු කල බව සඳහන් වාර්තාවල වගකිව යුතු නිලධාරියෙකු අධීක්ෂණය නොකල බවට තොරතුරු නොතිබුණි.

2.9 <u>අභ්‍යන්තර විගණනය.</u>

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. <u>පද්ධති හා පාලන.</u>

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් පාලනය

(ඈ) වාහන පාලනය